**ශීර්ෂය 13 - ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව**

**----------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

--------------------------------

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2020දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 ජූනි 14 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවට අදාල වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ වාර්තාව 2021 ජූලි 16 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී.ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

-----------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වාගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරීසහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

----------------------------------------------------------

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑමප්‍රබලවන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- කොමිෂන් සභාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

----------------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) මෙම වාර්තාවේ අංක 1.6.2(අ) දරන ඡේදයේ ඇතුලත් නිරීක්ෂණය සම්බන්ධයෙන් ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේදී නිවැරදි කර නොතිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය**

**පුනරාවර්තන වියදම්**

මූල්‍ය ප්‍රකාශනවලට අදාළ පුනරාවර්තන වියදම් ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වැටුප්, වේතනසහ අනෙකුත් සේවක ප්‍රතිලාභවැය ලෙජරය අනුව රු.128,852,579 ක් වුවද මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ රු.128,184,523ක් ලෙස දක්වා තිබුණි. | මෙම වෙනසට හේතුව ගමන් වියදම වන අතර එය වෙනත් පුනරාවර්ථන වියදම් යටතේ දක්වා ඇත. | නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) අනෙකුත් භාණ්ඩ හා සේවා වියදම වැය ලෙජරය අනුව රු.74,978,326 ක් වුවත් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේරු.75,646,381 ක් ලෙස දක්වා තිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | -එම- |

**1.6.2 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

**------------------------**

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීමේදී පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

| විගණන නිරීක්ෂණය<br>---------------------- | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම<br>---------------------------------- | නිර්දේශය<br>---------- |
|---|---|---|---|
| (අ) | 2004 වර්ෂයට පෙර අත්පත් කර ගත් වත්කම්මූල්‍ය නොවන වත්කම්ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි.ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කරමි. | සියළු වත්කම් නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ආ) | වාහනවල වටිනාකමට අදාලව, භාණ්ඩාගාර මුද්‍රිත සටහන් හා කොමිෂන් සභාවේ වාහන ලේඛනය අතර රු.7,552,881ක වෙනසක් පැවතුණි. | වාහනවල වටිනාකම් නිවැරදිව හඳුනා ගැනීමට කටයුතු කරමින් පවතින අතර ඒඅනුව ඉදිරියේ දී නිවැරදි කිරීමටකටයුතු කරනු ලැබේ. | වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතු වේ. |
| (ඇ) | 2015 හා 2019 වර්ෂවල රාජ්‍ය ආයතනයක් වෙත පවරාතිබුණු වාහන 02 ක රු.27,697,804 ක පිරිවැය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. | පවරන ලද වත්කම්වල අගය මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශනයෙන් ඉවත් කළ යුතු වේ. |
| (ඈ) | ඉකුත් වර්ෂයේ මිලදී ගත් පිරිවැය රු.294,900 ක්වූයතුරු පැදියක් 2021 පෙබරවාරි 28 දින වන විටත්ප්‍රාග්ධනිත කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි.ඉදිරියේ දී නිවැරදි කිරීමට කටයුතු කෙරෙනු ඇත. | මිලදී ගන්නා වත්කම් ප්‍රාග්ධනිත කළ යුතු වේ. |

## 2. මෙහෙයුම් සමාලෝචනය

### 2.1 සැලැසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව සමාලෝචිත වර්ෂය සඳහා ක්‍රියාකාරී සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

### 2.2 අපේක්ෂිත නිමවුම් මට්ටම ලබා නොගැනීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉකුත් වර්ෂයේ පැමිණිලි 4,266 ඇතුළුව2020 වර්ෂයේ විසදීම සඳහා තිබුණු මුළු පැමිණිලි 10,550 න් 3,812 ක් විසඳා සමාලෝචිත වර්ෂය අවසානයට පැමිණිලි 6,738 ක් ඉතිරිවී තිබුණි. මින් පැමිණිලි 23 ක් වසර 10 ට වැඩි කාලයක් තුල හා පැමිණිලි 1,804 ක් වර්ෂ 3 ත් වර්ෂ 10ත් අතර කාලය තුල ලැබුණු ඒවා විය. | කාර්ය මණ්ඩල හිඟය හා කොවිඩ් 19 වසංගතය නිසා ලැබෙන පැමිණිලි සංඛ්‍යාව අවසන් කිරීමට නොහැකි වී ඇත. සියළුම ඉතිරිවී ඇති පැමිණිලි විසඳීමට අවශ්‍ය පියවර ගෙන ඇත. | පැමිණිලි විසඳීම සඳහා කඩිනම් වැඩපිළිවෙලක් සකස් කළ යුතු වේ. |

### 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

| නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේඅදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- | --- |
| නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| ශ්‍රීලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසිසංග්‍රහයේ අංක 770(4) දරන මුදල් රෙගුලාසිය | කොමිෂන් සභාවේ වාහන 42 ක් පිළිබඳසමීක්ෂණයක් සිදු කර නොතිබුණි. | නිරීක්ෂණය හා එකඟ වෙමි.ඉදිරියේ දී යාවත්කාලීන කිරීමට කටයුතු කරමි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතුකළ යුතු වේ. |

## 2.4 වාර්ෂික කාර්යසාධන වාර්තාව

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10.2 ඡේදය ප්‍රකාරව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16.2 වගන්තිය ප්‍රකාරවකාර්යසාධන වාර්තාව මූල්‍ය ප්‍රකාශන සමඟ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | පිළිගනිමි. නිවැරදි කිරීමට අවශ්‍ය පියවර ගනිමි. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වේ. |

## 2.5 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) කල්බදු කාලය අවසන් මෝටර් රථ 03 ක අයිතිය පවරා ගැනීමට2021 මාර්තු 23 දින වන විටත්අපොහොසත්වී තිබුණි. | පිළිගනිමි.එම වාහන 03 හි අයිතිය වහාම පවරා ගැනීමට කටයුතු කර පොත් යාවත්කාලීන කිරීමට උපදෙස් දී ඇත. | වත්කම්වල අයිතිය තහවුරු කර ගත යුතු වේ. |
| (ආ) කොමිෂන් සභාව සතුයතුරුපැදි 20 ක අගය ගිණුම්ගත කර නොතිබුණි. | පිළිගනිමි. තක්සේරු කර අවසන් වූ වහාම පොත්වලට ගෙන යාවත්කාලීන කිරීමට උපදෙස් දී ඇත. | ආයතනය සතු වත්කම්වල පිරිවැය තහවුරු කරගෙන ගිණුම්ගත කළ යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | 2018 හා 2019 වර්ෂවල භාණ්ඩ සමීක්ෂණවාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණු අතර 2019භාණ්ඩ සමීක්ෂණයට අනුව අබලිවානේ ඇදි පුටු 14 ක් හා පාපැදියක්ඌණව පැවතුණි. | භාණ්ඩ සමීක්ෂණය සිදු කර තිබුණද අවසන් කර නොමැති බව පිළිගනිමි. 2020 භාණ්ඩ සමීක්ෂණය දැනට ආරම්භ කර ඇති බැවින් ඉන් අනතුරුව මේ පිළිබඳව කටයුතු කරමි. | චක්‍රලේඛ ප්‍රකාරව භාණ්ඩ සමීක්ෂණ සිදු කර ඒවායේ නිර්දේශ ක්‍රියාත්මක කළ යුතුය.ඌණතාවයන් සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ග ගත යුතු වීම. |

**3.** **මානව සම්පත් කළමනාකරණය**

**----------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ----------------------- | ------------------------------ | ----------- |
| (අ) | 2018 ජනවාරි 04 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 6.1 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර නොතිබූ අතරසමස්ථ කාර්ය මණ්ඩලය සඳහා වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් ද අත්සන් කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිට මෙම අඩුපාඩු සකස් කිරීමට සියළුම නිලධාරීන් දැනුවත් කර ඇත. | චක්‍රලේඛ උපදෙස් පරිදි කටයුතු කළ යුතු වේ. |
| (ආ) | 2020 දෙසැම්බර් 31 දිනට තනතුරු 95 ක් පුරප්පාඩුව පැවතුනඅතර,අධ්‍යක්ෂකවරු04 ක්,නියෝජ්‍යඅධ්‍යක්ෂකවරයෙක්, නීති නිලධාරි 12 ක්, මානව හිමිකම් නිලධාරි 23 ක් හා ප්‍රාදේශීය සම්බන්ධීකරණ නිලධාරි 02 ක් එයට ඇතුළත් වී තිබුණි. එසේම ස්ථිර පදනමින් නිලධාරීන් බඳවා නොගෙන වැඩ බැලීමේ පදනමට හා රාජකාරි ඉටු කිරීමේ පදනමට නිලධාරි 05 දෙනෙකු බඳවාගෙන තිබුණි. | 2017, 2018 හා 2020 වර්ෂවලදී බඳවා ගැනීම් සිදු කිරීමට පුවත්පත් දැන්වීම් පළ කළද වසර 15 ක පලපුරුද්දක් සහිත අයදුම්කරුවන් ඉල්ලුම් නොකිරීම හේතුවෙන් පුරප්පාඩු පිරවීමට නොහැකි වී ඇත. එබැවින් කොමිසමේ රාජකාරී බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා නිලධාරීන් පත් කිරීමට සිදු වී ඇත. | අතවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩුසම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ. |